““
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2346/49 – 2023 අගෝස්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා – 2023.08.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2016/129.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2335/12 දරන හා 2023.06.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, කොට්ටාව, ලියනගොඩ පාර, අංක 1144/5/ඒ හි පදිංචි කේ. ඩබ්. රංජන් සිසිර මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, ගාලු පාර, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411 හි පිහිටි සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 10/2021 දරන හා 2023.05.10 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 10/2021 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2024.06.06 දින සිට අවසන් වන බවට පනතේ 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 040207 – 11 (2023/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ලංකා ඉලෙක්ට්‍රිසිටි ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල,
ගාලු පාර,
කොළඹ 03.

දිනය : 2023 අගෝස්තු මස 07 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2023 ජුනි මස 06 දිනැති අංක 2335/12 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, කේ. ඩබ්. රන්ජන් සිසිර සහ ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් බැඳී සිටින්නා වූ ද, 2023 මැයි මස 10 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන :*

ඒ. ඩී. ඒ. සී. අයි. ප්‍රේමචන්ද්‍ර,
අතිරේක සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පරිපාලන),
සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,
1 වන මහල, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල,
අංක 411, ගාලු පාර, කොළඹ 03.

*පිටපත* : (අනෙක් පාර්ශ්වය)
කේ. ඩබ්. රන්ජන් සිසිර මයා,
අංක 1144/5/A,
ලියනගොඩ පාර,
කොට්ටාව, පන්නිපිටිය.

1. ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුට ම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) සහ 20(1) වන වගන්ති බලන්න)

2. දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද, යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 08 – 0269

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.